## ලයිස්තුගත සමාගම්වල සාංගමික යහපාලනය හා සම්බන්ධව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දායකත්වය

කොටස් වෙළෙඳපොළක් තුළ බොහෝ සමාගම් ලයිස්තුගත වන්නේ සමාගමේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමේ අපෙක්ෂාවෙනි. එය අළුතින් ලයිස්තුගත වන සමාගමක මූලික අරමුණක් වුවද ලයිස්තුගත වන නව සමාගමකට අත්කර ගත හැකි අමතර වාසි රැසක් ද පවතී. ඉන් එක් අමතර වාසියක් වනුයේ සමාගමක සාංගමික යහපාලනය ඉහළ නංවා ගැනීමට අවස්ථාවන් ලයිස්තුගතවීම මගින් ලැබීමයි. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගතවීමේ නීති, සමාගම් පනත ආදී විවිධ නීතිරීති අනුව අළුතින් ලයිස්තුගත වන සමාගමක් කටයුතු කිරීම අනිවාර්ය වේ. මේ නිසා නිසි පිළිවෙළක් අනුව, නිසි ක්‍රමවේදයක් අනුව කටයුතු කරන සමාගමක් බවට පත්වීම තුළින් සමාගමක සාංගමික යහපාලනය ඉහළ යනු ඇත.

## කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් මොනවාද?

කොටස් හිමියෙක් වශයෙන් ඔහුගේ අයිතිවාසිකම් මොනවාද යන්න දැන සිටීමද ඉතා වැදගත් වේ. සාමාන්‍ය කොටස් හිමියෙක් නම් ඔහුට සමාග මක වාර්ෂික මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමි වේ. එසේම සමාගමක සාමාන්‍ය කොටස් හිමියන් වශයෙන් එම සමාග මේ මූල්‍ය වාර්තා ලබාදීමද සමාගම් විසින් සිදු කළ යුතුය. එය කොටස් හිමියන්ගේ අයිතියකි. එසේම සාමාන්‍ය කොටස් හිමියෙක් වශයෙන් සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ, නොමිලේ කොටස් සහ අනෙකුත් වරප්‍රසාද ලැබීමට ඔහුට/ඇයට අයිතියක් ඇත.

## මූල්‍ය වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වන සමාගම්වල කොටස් රඳවා තබාගෙන සිටීම කොතරම් දුරට ප්‍රායෝගිකද?

සාමාන්‍යයෙන් කොටස් වෙළෙඳපොළ ආයෝජනය යනු දිගුකාලීන ආයෝජනයකි. එහෙත් දිගුකාලය කුමක්ද යන්න නිශ්චිතව සඳහන් කළ නොහැකිය. මෙහිදී ආයෝජකයා මතක තබා ගත යුත්තේ කොටස් මිලදී ගැනීමෙන් අනතුරුව තමන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඒවා නැවත විකුණා මුදල් කර ගැනීමට හැකියාව පවතින බවයි. එහිදී තම ආයෝජන අරමුණු සහ අනෙකුත් සාධක සැළකිල්ලට ගෙන ආයෝජනයෙහි නිරතවීම නුවනැති ආයෝජකයකුගේ ලක්ෂණයකි.

ඒ අනුව මූල්‍ය වාර්තා ප්‍රමාද වීමට හේතු සොයා බැලීමට හැකි නම් එය ඉතා අගනේය. මූල්‍ය වාර්තාවක් ප්‍රමාද වූ සැණින් කලබල නොවී ඒ පිළිබඳව විස්තර සොයා බලා ආයෝජන තීරණ ගැනීම වැදගත් වේ. ඊට හේතුව සමහර විට සමාගම් පාර්ශවයෙන් එතරම් කොටස් මිලට බල නොපාන ප්‍රශ්ණයක් නිසා මූල්‍ය වාර්තා ප්‍රමාද විය හැකිය. හැකිතරම් දුරට අවධානයෙන් සිට ගණුදෙනුවල නිරතවීම වැදගත්ය.

## ලයිස්තුගත සමාගම්වල අතීත මූල්‍ය වාර්තා ලබා ගන්නේ කෙසේද?

ලයිස්තුගත සමාගම්වල අතීත මූල්‍ය වාර්තා ආයෝජකයෙකුට ප්‍රයෝජනවත් විය හැකිය. සමාගම්වල අතීත හැසිරීම් අනුව සමාගමේ ඉදිරි ගමන් මග ද තිරණය වන අවස්ථා දැකගත හැකිය. ඒ අනුව සමාගමක අතීත මූල්‍ය වාර්තා අදාළ සමාගමේ වෙබ් අඩවියට පිවිසීම හෝ කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවියට පිවිසීම මගින් සොයා ගත හැකි වේ.

## සමාගමක් ලබන ලාභ අලාභ පිළිබඳව දැන ගත හැක්කේ කෙසේද?

සමාගමක ලාභ අලාභ තත්ත්වය පිළිබඳව දැනගත හැක්කේ එම සමාගම විසින් නිකුත් කරනු ලබන විවිධ මූල්‍ය වාර්තා මගින්ය. කාර්තුමය වශයෙන් සහ වාර්ෂිකව නිකුත් කරනු ලබන වාර්තා ඒ අතර වේ. එවැනි වාර්තාවල සඳහන් තොරතුරු කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවියට පිවිසීම මගින් අධ්‍යයනය කළ හැකිය. වර්තමානය වන විට ආයෝජකයකුට තම ස්මාර්ට් දුරකථනයකින් මෙම තොරතුරු වෙත ළඟාවීමටද හැකියාව ඇත.


**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

28 සහ 29 වන මහළ, නැගෙනහිර කුළුණ.
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය
කොළඹ 01.
දුරකථන : +94 11 2143843
ෆැක්ස් : +94 2439149
ඊ-මේල් : mail@sec.gov.lk
වෙබ් අඩවිය: www.sec.gov.lk


# කොටස් වෙළෙඳපොළ, මූල්‍ය වාර්තා පරිහරණය සහ ප්‍රතිලාභ උපරිම කර ගැනීම



## ලයිස්තුගත සමාගමක් යනු කුමක්ද?

කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි වී කොටස් හෝ ණයකර නිකුත් කර ඇති සියළුම සමාගම් ලයිස්තුගත සමාගම් ලෙස හඳුන්වනු ලබයි. අවශ්‍ය සුදුසුකම් සපුරනු ලබන සමාගමකට කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගතව කොටස් සහ ණයකර නිකුත් කිරීමට හැකියාව ඇත. මෙසේ කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත වී ඇති සමාගම්වල නම් අගින් පී එල් සී (PLC) යන යෙදුම ඇතුළත් කර ඇත.

## ආයෝජන සඳහා සුදුසු සමාගමක් තෝරාගන්නේ කෙසේද?

කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත සමාගමක් තෝරා ගැනීමේදී විවිධ සාධක සළකා බැලීමට හැකියාව පවතී. එම සාධක අතර සමාගම නිරත වන්නේ කුමන ව්‍යාපාර ක්ෂේත්‍රයකද, නිෂ්පාදනය කරන්නේ කුමන භාණ්ඩ හා සේවාද, එය ලාභ ලබන තත්ත්වයේ පවතින එකක්ද, සමාගමේ විශාලත්වය කෙසේද, එහි ප්‍රධාන පෙළේ කොටස් හිමියන් කවුරුන්ද, සමාග මේ අනාගත සංවර්ධන කටයුතු ආදී නොයෙකුත් කරුණු ඊට ඇතුළත් විය හැකිය. මේ කරුණු අතර විශේෂයෙන්ම සමාගමක ලාභ අලාභ තත්ත්වය පිළිබඳව සොයා බැලීම ඉතා වැදගත් වේ. ඒ අනුව කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී ඉහළ කාර්සාධනයක් සහිත ලාභ ලබන සමාගම් තෝරාගෙන ආයෝජනය කිරීම හරහා ඉහළ ප්‍රතිලාභයන්වලට ද හිමිකම් කීමට අවස්ථාව උදාකර ගත හැකි වේ.



## මූල්‍ය වාර්තාවක් යනු කුමක්ද?


මූල්‍ය වාර්තාවක් යනු යම් සමාගමක මූල්‍යමය හැසිරීම් පෙන්නුම් කරනු ලබන ලියවිල්ලකි. මූල්‍යමය තොරතුරු යනු සමාගමේ ආදායම් සහ වියදම් තත්ත්වය, සමාගමේ ගෙවුම් ශේෂ තත්ත්වය, අරමුදල් ප්‍රවාහ තත්ත්වය ආදී තවත් කරුණු කිහිපයකි. මූල්‍ය වාර්තාව කුමක්ද යන්න අනුව එහි සඳහන් කරුණු වෙනස් විය හැකිය.

විවිධ මූල්‍ය වාර්තා වර්ග මොනවාද?
සමාගමක් විසින් නික්තු කරන ප්‍රධාන මූල්‍ය වාර්තා වර්ග 4ක් දැක ගත හැකිය.

1. ගෙවුම් ශේෂ ලේඛනය
2. ආදායම් වියදම් වාර්තා
3. අරමුදල් ප්‍රවාහ වාර්තාව
3. කොටස් හිමියන්ගේ හිමිකම් පිළිබඳ වාර්තාව

## මූල්‍ය වාර්තාවල අඩංගු කරුණු මොනවාද?

මෙම මූල්‍ය වාර්තාවල ආයෝජකයෙකුට අවශ්‍ය කරුණු රාශියක් අන්තර් ගත වේ. විශේෂයෙන්ම ත්‍රෛයිමාසික මූල්‍ය වාර්තාවල අදාළ මාස 3ට (කාර්තුවට) සමාගමේ මූල්‍ය තත්ත්වය විස්තර කරයි. එහි ආදායම, වියදම් තත්ත්වය, ලාභ ආලාභ තත්ත්වය, බදු අයකිරීම්, සමාග මේ අදාළ දිනට වත්කම් සහ වගකීම්, කොටස් හිමියන්ගේ තත්ත්වය, ආදායම් ගලා ඒම ආදී විස්තර එහි ඇතුළත් කරනු ලබයි. ඒ අනුව වාර්ෂික වාර්තාවකද අඩංගු වන්නේ මෙම කරුණු සහ තවත් සමහර විස්තරයි. විශේෂත්වය වන්නේ වසර පුරාම සමාගම ක්‍රියාත්මක වූයේ කෙසේද යන්න එහි විස්තර කරනු ලැබීමයි. මෙම වාර්ෂික වාර්තා විගණනයට ලක් කල වාර්තවන් වේ.



## මූල්‍ය වාර්තාවල අඩංගු කරුණු වල සත්‍ය / අසත්‍යතාවය, විශ්වාසනීයත්වය තහවුරු කරන්නේ කෙසේද?

ඉහත සඳහන් කළ මූල්‍ය වාර්තා ඇතුළත් සමාගමක වාර්ෂික වාර්තාව පිළිගත් ස්වාධීන විගණන ආයතනයක් සහතික කළ යුතුය. සියළුම ලයිස්තුගත සමාගම් විගණනය කරන ලද තම වාර්ෂික වාර්තාව අදාළ මූල්‍ය වර්ෂය අවසානයේදී කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතුය. ලයිස්තුගත සමාගමක් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පරීක්ෂාවට ද ලක් වෙයි.

කිසියම් ලයිස්තුගත සමාගමක් තම මූල්‍ය වාර්තා වල අසත්‍ය තොරතුරු ඇතුළත් කළහොත් එයින් සමාගමේ කීර්තිනාමයට හානියක් සිදුවන අතර සමාගම සම්බන්ධයෙන් ජනතාව අතර ඇති විශ්වාසනීයත්වය පළුදුවීමට ද හේතු වේ. මේ නිසා ලයිස්තුගත සමාගම් සෑම විටම තම මූල්‍ය වාර්තාවල නිවැරදි සහ විශ්වාසවන්තභාවයෙන් යුතු තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරයි.

## දැනුවත් ආයෝජන තීරණ සඳහා මූල්‍ය වාර්තා පරිහරණය කිරීමේ ඇති වැදගත් කම

ආයෝජකයෙකුට තම ආයෝජන තීරණ නිවැරදිව ගැනීමට මූල්‍ය වාර්තා වලින් සැළසෙනුයේ මනා පිටුවහළකි. සමහර අවස්ථාවල ආයෝජකයන් ලයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගනුයේ කිසිදු සොයාබැලීමකින් තොරවය. විශේෂයෙන්ම ලාභදායීත්වය පිළිබඳව ආයෝජකයකු කල්පනාකාරීවීම ඉතා වැදගත් වේ. කාර්ය බහුල පුද්ගලයෙකුට මෙම මූල්‍ය වාර්තාවල සඳහන් සියළු කරුණු කියවා අවබෝධ කර ගැනීමට අවස්ථාව නොලැබීමට පුළුවන. එහෙත් හැකි සෑම අවස්ථාවකම අඩුම තරමින් තමන් ආයෝජනය කරනු ලබන සමාගම ලාභ ලබන තත්ත්වයේ පවතින්නේද, යන්න විමසා බැලීමක් කිරීම ආයෝජනයේ ආරක්ෂාව අතින් වැදගත් වේ. එමෙන්ම අවදානම අඩු වේ. තවද, මෙම වාර්තා පරිහරණයට ඉඩක් නොලැබුණද, තම ආයෝජන උපදේශකවරයාගෙන් මූල්‍ය වාර්තාවල තත්ත්වය ගැන යම් විමසීමක් කිරීම වැදගත් වේ.

## කොටස් වෙළෙඳපොළින් ප්‍රතිලාභ ලැබීමට මූල්‍ය වාර්තා පරිහරණය කළ යුතුම ද?

කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කරන්නන්ගේ ආයෝජන අරමුණ එකිනෙකට වෙනස් විය හැකිය. එනම් සමහර ආයෝජකයන් දිගුකාලීනව ආයෝජනය කිරීමට කැමති අතර තවත් සමහර ආයෝජකයන් කෙටි කාලයක් සඳහා ආයෝජනය කිරීමට කැමතිය. කුමන ස්වභාවයක ආයෝජකයකු වුවද ලයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් යම් අවබෝධයක් ඇතිව ආයෝජනය කිරීම වඩාත් උචිතය.

මේ නිසා ඔබ කොටස් මිලදී ගන්නා සමාගම ගැන අවධානයෙන් සිටීම වැදගත් වන අතර මූල්‍ය වාර්තා පරිහරණය අනිවාර්ය එකක් නොවූවද ඉතා වැදගත් කරුණක් බව මතක තබා ගත යුතුය.




## මූල්‍ය වාර්තා නිකුත් කරන්නේ කොපමණ කාලයකට වරක්ද?

සමාගමක් මූල්‍ය වාර්තා සෑම දිනකම නිකුත් නොකරයි. සමාගමක් සෑම කාර්තුවකටම වරක් මූල්‍ය වාර්තා නිකුත් කරනු ලබයි. ඒ අනුව කාර්තුමය මූල්‍ය ප්‍රකාශන 4ක් සමාගමක් වසරක් තුළ නිකුත් කළ යුතු වේ. එමෙන්ම සමාගමක වසර පුරා සියළු ක්‍රියාකාරකම් එහි වාර්ෂික වාර්තාවෙන් දැක බලා ගත හැකිය. කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගතවීමේ රීති අනුව සෑම ලයිස්තුගත සමාගමක්ම තම කාර්තුව හෝ වර්ෂය අවසාන වී දෙන ලද දින ගණනක් තුළ අදාළ මූල්‍ය වාර්තා එළිදැක්විය යුතු බවට සඳහන් කර ඇත. එසේ නීති සමඟ අනුගත නොවන්නා වූ සමාගම් පිළිබඳව සොයා බලා ඊට අවශ්‍ය පරිදි පියවරයන් ගැනීම කොළඹ කොටස් හුවමාරුව විසින් සිදු කරනු ලබයි. එමගින් ආයෝජකයින්ට තම ආයෝජන පිළිබඳ විශ්වාසය පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

## සමාගමක් අළුතින් ලයිස්තුගත වන විට මූල්‍ය වාර්තා නිකුත් කරනවාද?



කිසියම් සමාගමක් කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගතවීමට පෙර තම සමාගම සතු සියළු තොරතුරු හෙළිදරව් කළ යුතුය. විශේෂයෙන්ම මූලික කොටස් නිකුතුවක් සිදුකරන සමාගමක් සංස්ථා ප්‍රකාශයක් (Prospectus) නිකුත් කිරීම අනිවාර්ය වේ. ඒ අනුව සමාගම කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන පුවරුවෙන් ලයිස්තුගත වන්නේ නම් ලයිස්තුගත කිරීමට පෙර වසර 3ක් සඳහා අඛණ්ඩ වසර 3ක බදු පසු ලාභයක් පෙන්නුම් කළ යුතුය. එයින් කියවෙනුයේ අදාළ සමාගම අළුතින් ලයිස්තුගත වන විට මූල්‍ය වාර්තා නිකුත් කිරීම සිදු කළ යුතු බවයි.



## සමාගමක් නියමිත වෙලාවට කාර්තුමය මූල්‍ය වාර්තා හෝ වාර්ෂික වාර්තා නිකුත් නොකළහොත් ලයිස්තුගත නියමයන් කඩකළ සමාගමක් බවට පත්වෙනවාද?

ඕනෑම ලයිස්තුගත සමාගමක් කොළඹ කොටස් හුවමාරුවේ ලේඛනගත නියමයන් අනුව කටයුතු කළ යුතු වේ. එසේ නියම කර තිබියදී අදාළ කාළසීමාව (කාර්තුව හෝ මූල්‍ය වාර්ෂය අවසානයේ) තුළ මෙම වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් කොළඹ කොටස් හුවමාරුව විසින් එකී සමාගම් "Watch List" වෙත යොමු කරනු ලැබේ. "Watch List" යනු විවිධ හේතු මත ලයිස්තුගත නියමයන්, කොන්දේසි ඉටු කිරීමට අපොහොසත්වීම නිසා සමාගම් තාවකාලිකව යොමුකරනු ලබන පුවරුවකි.

## සමාගමක් මූල්‍ය වාර්තා නිකුත් කිරීම ප්‍රමාද කරන්නේ නම්, එම සමාගමේ කොටස් හිමියෙකු කෙසේ හැසිරිය යුතුද?

ලයිස්තුගත සමාගමක් තම කාර්තුමය මූල්‍ය ප්‍රකාශන නිසි වේලාවට කොටස් වෙළෙඳපොළ වෙත නිකුත් කළ යුතු අතර ආයෝජකයන්ට ඒවා www.cse.lk යන කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට හැකියාව ඇත. එමගින් ආයෝජකයෙකුට තමන් කොටස් මිලදී ගෙන ඇති සමාගමෙහි තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම ආයෝජනයේ විශ්වාසය තහවුරු කර ගැනීමට ද හැකියාව ලැබේ.

නමුත් සමහර ලයිස්තුගත සමාගම් මෙම මූල්‍ය වාර්තා නිකුත් කිරීම නියමිත වේලාවට සිදු නොකරයි. එසේ වීමට විවිධ හේතු බලපාන අතර ආයෝජකයින්ට ආයෝජන තීරණ ගැනීමට එය බාධාවක් වේ. ඒ අනුව යම් සමාගමක් මෙසේ මූල්‍ය වාර්තා නිකුත් කිරීම ප්‍රමාද කරන විට තම ආයෝජන උපදේශකවරයාගෙන් ඒ පිළිබඳව විමසා උපදෙස් ලබා ගැනීම කළ යුතු නිවැරදි පියවරකි. තවද සමාගම යම් හෙයකින් නොකඩවා පාඩු ලබා ඇති බවට තොරතුරු ඇත්නම් ආයෝජන උපදෙස් ද ලබාගෙන සමාගමේ තවදුරටත් රැඳී සිටීම සුදුසු ද එසේ නැතහොත් සමාගමෙන් ඉවත්ව වෙන සමාගම්වල ආයෝජනය කිරීම සුදුසු ද යන්න තීරණය කළ යුතුය. මෙහිදී ආයෝජකයකු මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ යම් ලයිස්තුගත සමාගමක් තම මූල්‍ය වාර්තා නිකුත් කිරීම ප්‍රමාද කරන්නේ නම් එම සමාගමේ කිනම් හෝ ගැටළුවක් ඇති බවයි.